# ආර්ථිකය පිළිබඳ බෞද්ධ ආකල්ප

අහුන්ගල්ලේ සීවක හිමි

බුදු දහම පරලොව ගැන පමණක් කථා කරන ජීවිතයේ නිසරු බව පෙන්වා දෙන ආගමක් ලෙස සමහරු හඳුන්වති. මේ අදහස උපෙක්ෂා සහගතව විමසීමකට භාජන කළහොත් එය එසේම යැයි පිළිගත නො හැකිය. ඊට හේතුව බුදු දහමෙන් මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට නිතර උපදෙස් ලැබෙන බැවිනි. බුදුරජාණන් වහන්සේගේ මූලික අරමුණ සසර දුක පෙන්වා දී සත්වයා සසරින් එතර කරවීම වූ නිසා ජීවිතයේ නිසරු බව පෙන්වා දුන් බව සත්‍යයකි. එසේ වුවත් දෛනික ජීවිතයේදී හමුවන විවිධ ගැටළු නිරාකරණය කරගත යුතු මාර්ගය දහමේ පැහැදිලි කර ඇත. ඒ අනුව බුදු දහම ලෞකික ජීවිතය තෘප්තිමත් එකක් බවට පත්කර ගැනීමේ ජීවන මාර්ගය ද පැහැදිලි කරයි. ගිහි ජීවිතයක් සාර්ථකව ගොඩ නැගීමේදී සමබර සරු ආර්ථිකයක් අත්‍යාවශ්‍යය. ධනය ඉපැයීම, පරිභෝජනය, ධනය ආරක්ෂා කර ගැනීම, ධනය සමාජයේ බෙදිය යුතු අයුරු ආදි ආර්ථිකය පිළිබඳ විවිධ ප්‍රශ්න උදෙසා බුදුරජාණන් වහන්සේ දුන් උපදෙස් ත්‍රිපිටකයේ විවිධ සූත්‍රවල ඇතුලත්ව පවතී.

බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි දීඝජානු කෝළිය පුත්‍රයා මෙලොව - පරලොව සුව සඳහා ධර්මයක් දේශනා කරන ලෙස ආයාචනා කළ අවස්ථාවේදී මෙලොව සුව සඳහා (දිට්ඨ ධම්ම සුඛාය) දුන් උපදෙස් සරු ආර්ථිකයක් සඳහා දෙන ලද උපදේශයක් ලෙස අගය කළ හැකිය. එහිදී උට්ඨාන සම්පද, ආරක්ඛ සම්පද, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා[1] යනුවෙන් කරුණු හතරක් සඳහන් කරයි. මේ හතර මෙලොව පරලොව සැපයට හේතු වේ.

උට්ඨාන සම්පද යනු උත්සාහයයි. ජීවිතයක අපෙක්ෂාවන් අසීමිතය. ඒ සියලුම අපේක්ෂාවන් එක ජීවිතයකදී සම්පූර්ණ කර ගැනීමට අපහසුය. නමුත් තමන් බලාපොරොත්තු වන අභිමතාර්ථයන් කරා ලංවනුයේ උත්සාහවන්තයා පමණි. ඒ අනුව ධනය ඉපයීමේදී ද උත්සාහය තිබිය යුතුමය. ධනය ඉපදවීමෙහිලා ගන්න උත්සාහය සමාජයේ ආචාර ධර්මවලට පටහැනි නොවිය යුතුය. ආර්ය අෂ්ටාංගික මාර්ගයේදී ද යහපත් ජීවිතයක් සඳහා (සම්මා ආජීව) යහපත් උත්සාහයක් (සම්මා වායාම) අවශ්‍ය බව අවධාරණය කරයි. අනුන්ගේ ශ්‍රමය වංචාකාරී අන්දමින් සූරාකමින් හෝ වෙනත් හොරකම් මැරකම් ආදියෙන් ධනය හරිහම්බ කිරීම බුදු දහමෙන් හෙලා දකී. එමෙන්ම ස්වාමි පක්ෂය තම සේව්‍ය පක්ෂයට ශ්‍රමයට සරිලන වැටුපක් ගෙවීමත්, වැටුපට සමාන ශ්‍රමයක් සේවය්‍ය පක්ෂය විසින් වැය කිරීමත් සිදුවිය යුත්තකි. ධනය සොයන පුද්ගලයා පළමුව තමාගේ හැකියාවන් හඳුනාගත යුතුය. දක්ෂතාවය, අවශ්‍යතාවය අනුව යම්කිසි වෘත්තියක නියුතු පුද්ගලයා දුන් සීතය, උෂ්ණය, කුසගින්නිය, බඩපිරී ඇත, අළුයමය, මධ්‍යාහ්නය, සවසයයි[2] වැඩ කටයුතු අතපසු කිරීමෙන් පිරිහීමට පත්වේ. ජීවිතයට මුහුණ දෙන හොඳම ක්‍රමය අද ඇති වැඩ අදම කිරීම බව සිතෙහි තබාගත යුතුය. ධනය සොයන පුද්ගලයා තුළ උපාය, විමසීම, සංවිධාන ශක්තිය, නුවණ වැනි උපක්‍රම පිහිටීම අවශ්‍යයයි. එවැනි උපක්‍රම වලින් යුත් පුද්ගලයා නොබෝ කලකින්ම ධනවතෙක් වන බව මී මලකුණකින් කෝටිපතියකු වූ බව පවසන චුල්ලසෙට්ඨි ජාතකයෙන් පැහැදිලි වේ. මේ නිසා උත්සාහය ධනය ඉපයීමේදී අවශ්‍යම අංගයකි.

ආරක්ඛ සම්පද නම් සපයාගත් ධනය විනාශ වීමට යා නොදී රැක ගැනීමයි. ධන විනාශයට හේතු හයක් සිඟාලෝවාද සූත්‍රයේදී දක්වෙයි. රහමෙර පානය, අකාලයෙහි වීථි සංචාරය, නාට්‍ය දර්ශනවලට නිතර යාම, පාපමිත්‍ර සේවනය, අලසබව යනු ඒවායි. පරාභව සූත්‍රයේදී ස්ත්‍රීන්ට ලොල්වීම (ඉත්ථිධුත්තො) සුරාවට ලොල්වීම (සුරාධුත්තො) සූදුවට ලොල්වීම (අක්ඛ ධුත්තො) යන කරුණු නිසා උපයන ධනය විනාශ වෙන බව පෙන්වා දෙයි. එසේම රජදරුවන්ගෙන්, සොරුන්ගෙන්, ගින්නෙන්, දියෙන්, අප්‍රිය නෑයන්ගෙන් ආදී ක්‍රම වලින්ද ධනය විනාශ වීමට ඉඩ ඇත. ධනවත් අය ටික කලකින්ම දිළිඳු වන්නේ නැතිවූ දෙය සොයා නො බැලීම, දිරාගිය දේ ප්‍රතිසංස්කරණය නො කිරීම, කෑමබීමට පමණ ඉක්මවා වියදම් කිරීම, චරිතය දූෂිත වූ පුද්ගලයෙකු පවුලේ නායකත්වය දැරීම වැනි කරුණු නිසාවෙනි.[3] මේ නිසා ධාර්මිකව උපයා ගත් ධනය විනාශ වීමට ඇති මාර්ග රාශියකි. ඒ ගැන සිහිය යොදවා ධනය නිකරුණේ වියදම් නො කිරීමට වග බලා ගැනීම කළ යුතුය.

කල්‍යාණ මිත්තතා නම් සත්පුරුෂයන් ආශ්‍රය කිරීමයි. මෙයද ධනය තරකර ගැනීමෙහි ලා බලපාන්නකි. ජීවිතයේදී ලැබෙන බොහෝ දුක් ගැහැට ලැබෙනුයේ අසත්පුරුෂයන් නිසාය. සමහර විටක හිරගෙය පමණක් නොව පෝරකය හිමිවීමට අසත්පුරුෂ ආශ්‍රය හේතු වේ. පාපමිත්‍රයන් තම මිතුරා නිතරම වැරදි මාර්ගයට යොමු කරන නිසා ඔහුගේ ධනය බලාසිටිද්දීම විනාශයට යයි. මේ නිසා ආර්ථික සුරක්ෂිතතාවයට සුහද කලණ මිතුරන්ගේ ආධාරය උපකාරී වේ.

සමජීවිකතා නම් අය වැය ගැන දැනුමක් ඇතිව සමසේ ජීවිතය ගෙන යැමයි. අය වැය තරාදියක් මෙන් සමබර විය යුතු බව කියවේ. ඒ සඳහා බුදු දහමෙන් අවවාද ලැබෙනුයේ මෙසේය.

''එකෙන හොගෙ භුඤ්ජෙය්‍ය – ද්විහි කම්මං පයොජයෙ
චතුත්ථං ච නිධාපෙය්‍ය – ආපදසු භවිස්සති''[4]

උපයන ධනය කොටස් හතරකට බෙද එයින් කොටසක් කෑම, බීම, ඇඳීම, පැළැඳීම වැනි එදිනෙද කටයුතුවලට යෙදිය යුතුය. කොටස් දෙකක් තම ව්‍යාපාර කටයුතුවල අභිවෘද්ධිය සඳහා යෙදවිය යුතු බවත් අනික් කොටස අනාගතයේ ඇතිවන ආපදවකදී ප්‍රයෝජනයට ගැනීමට ආරක්ෂා කර ගත යුතු බවත් ඉගැන්වේ. මෙසේ ක්‍රමානුකූලව අය වැය බෙදගෙන කටයුතු කිරීමෙන් නිරවුල් ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබේ. එසේම ඔහුගේ උපන් භෝගයෝ ද දියුණුවට පත්වෙති.

ධනය ඉපැයීම ධාර්මික විය යුතුයි. අධර්මයෙන් ධනය ටික කලකින්ම බොහෝ සේ උපයාගත හැකි වුවත් එය අස්ථිරය. එසේ හම්බ කිරීම හිතට විරුද්ධ නිසා කවද හෝ ඔහු පසුතැවිල්ලට ද පත් වෙයි. වැරදි ධනෝපායන ක්‍රම නිසා සමාජයේ ගැරහීමට භාජනය වේ. හිර දඬුවම් විඳීමට හා දඩගෙවීම් ආදියට ද පත් වෙයි. ඒ නිසා උත්සාහයෙන්, වීර්යයෙන් (උධ්‍යාන විරියාධි ගතෙහි) ශ්‍රම ශක්තියෙන් (බහාබල පක්ඛිතෙහි) දහඩිය මහන්සිය වැගිරවීමෙන් (සෙදවක්ඛිතෙහි) යනාදි ක්‍රමවලින් ධාර්මිකව ධනයක් උපද්දවිය යුතුයි. (ධම්මෙන ලද්දෙන හොගෙහි) සත්ව වෙළඳාම, අවි ආයුධ වෙළඳාම මත් ද්‍රව්‍ය වෙළඳාම, විෂ ද්‍රව්‍ය වෙළඳාම, මාංශ වෙළඳාම යන පඤ්චවිධ අධාර්මික වෘත්තීන්ගෙන් තොරව ඒ සීමාවන් නො ඉක්මවා ධනය රැස්කර ගැනීමට බුදු දහමෙන් ඉඩ සලසා ඇත. අධාර්මික ප්‍රයෝගවලින් ධනය ඉපැදවීමෙන් සමාජයේ පිළිගත් ආචාර ධර්ම කෙලෙසා දැමීමක් සිදුවෙයි.

නිධිකණ්ඩ සූත්‍රයේදී ධනය ''නිධාන'' යන නමින් හඳුන්වයි. එහිදී ධනය කොටස් කරනුයේ මෙසේය. ථාවර නිධාන, ජංගම නිධාන, අංග සම නිධාන, අනුගාමික නිධාන යනාදි ලෙසිනි.[5] ථාවර යනු ස්ථිරව ඇති කෙත්, වතුපිටි ආදියයි. ජංගම නිධාන යනු දාසිදස්, ඇත්, අස්, ගව, එළු, බැටළු ආදී හැසිරෙන වස්තූන් ය. අංග සම නිධාන යනු ඉගෙනගත් අධ්‍යාපනයෙන් උපයන මිල මුදල් හා තැන්පත් කර ඇති ධනයයි. අනුගාමික නිධාන යනු දන, ශීල, භාවනා වශයෙන් රැස් කරනලද පින් නමැති ශක්ති විශේෂයයි. මෙහි දැක්වෙන අනුගාමික නිධානය අභ්‍යන්තර පාරිශුද්ධියට උපකාරී වන්නකි. එයින් මෙලොව පරලොව දෙලොව සුභසිද්ධිය ලභාකරවයි.

විවිධ ප්‍රශ්න බාධක දුෂ්කරතා මැද ධනය හරිහම්බ කර ගත්තත් එය ගොඩගසාගෙන සිටීම බුදුසමය අනුමත නොකරයි. එවැනි මසුරු ධනපතියන් වෙත වැඩමවා ඔවුනට ධර්මය දෙශනා කොට ඔවුන් දානපතියන් බවට පරිවර්තනය කිරීමේ සිද්ධි බෞද්ධ සාහිත්‍යයේ දක්නට ලැබේ. සමහරු ධනය පොදිගසාගෙන සිට මැරී ගොස් දුක්ඛිත ආත්මවල ඉපදෙන බව තෝදෙය්‍ය බමුණාගේ කථාවෙන් හෙළිවේ.[6] ඔහු කෝටිපතියෙක් වූ අතර මැරීගොස් මසුරුකම නිසා එම ගෙදරම බලුපැටියකු වී ඉපදීමේ පුවතක් එයින් ගම්‍ය වේ. මේ සිද්ධියෙන් ධනය තිබියදීත් එය පොදු යහපතට නොයොදන මසුරු ධනවතුන්ට එල්ලකරනුයේ උපහාසයකි. ඉල්ලීස ජාතකයෙන් පෙන්වාදෙනුයේ ධනය ගොඩගසාගෙන නොකා නොබී සිටින එය පොදු යහපතට නො යොදවන අයගේ ධනය බලෙන් හෝ සමාජයේ සුභසිද්ධිය සඳහා යෙදවීම නිවරද බවයි. සංඝ සමාජය තුල පෞද්ගලික අයිතියට ඉඩක් නැති අතර පොදු අයිතිය සුරක්ෂිත බවට පත්කර තිබීම වැදගත් අංගයකි. එය සාංඝික ක්‍රමය නමින් හඳුන්වයි. රකුසෙක් අරක්ගත් විලේ ජලයෙන් රකුසාටවත්, අන් සත්වයෙකුටවත් ප්‍රයෝජනයක් නැත. එසේම මසුරු පුද්ගලයන් සතු ධනයෙන් ද තමාටවත්, අනුන්ටවත් වැඩක් නැත. මංසන්ධියක ඉදිවුණු පොකුණකින් ජනතාවට පැන් බී නාගෙන සැනසෙන්ට හැකිය. එසේම පොදු යහපතට ධනය යොදවන පුද්ගලයාගේ ධනය ද ඉහතකී පොකුණ මෙන් සමාජයට හිතකර කටයුතු කෙරෙන බව පෙන්වා දී තිබේ. මේ කරුණුවලින් ධනය පොදු අයිතියට යටත්විය යුතු බව බුදුදහම අවධාරණය කරන බව පෙනේ. ජීවිතයේ එකම පරමාර්ථය ධනය උපයා ගැනීම නොවුනත් උපයාගත් ධනයෙන් තමන් කා බී ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට ඉඩ ලැබේ. ගිහිගෙයි වසන්නවුන් ධනය ඉපදවිය යුත්තේ තමන්ගේම ප්‍රයෝජනයට මෙන්ම මව්පිය, අඹුදරු, ඤාති මිත්‍ර, දාසිදස් ආදීන්ගේ සුඛ විහරණය පිණිසත්ය. එසේ ඒ අයට තමන්ගෙන් ඉටුවියයුතු යුතුකම් ඉටු කිරීම මිනිසත් බව අලංකාර කරවන්නකි. එසේම ආපදවකදී තමන්ගේ යහපතට යෙදවීමත්, මළගිය ඤාතීන්ට පිංපෙත් දීමටත් (ඤාතිබලි) ආගන්තුකයන්ට සත්කාර සම්මාන කිරීමටත් (අතිථිබලි) පරලොව ගිය අයට පිංදීම ආදියටත් (පුබ්බපෙතබලි) ධනය යෙදවීමෙන් තම සාමාජීය යුතුකම් ඉටුකිරීමට බුදුසමය උගන්වන බව පෙනේ. මේ කරුණුවලින් ධනය ඉපයීමේ පරමාර්ථය මනාව වටහාගත හැකිය.

ධනය සමාජයේ බෙදිය යුතු අයුරු කූටදන්ත[7] මහාවක්කවත්තිසීහනාද[8] වැනි සූත්‍රවලින් හෙලිවෙයි. මහාවක්කවත්තිසීහනාද සූත්‍රයේ එන හැටියට දිළිඳුකම රටක ඇතිවූවිට දසඅකුසලයන් මුල්බැස ගන්නා බව පෙනී යයි. ''අධනානං ධනෙ අනුප්පදීයමානෙ දළිද්දියං වෙපුල්ලමගවාසි දළිද්දියෙ වෙපුල්ලගතෙ අදින්නාදනං වෙපුල්ලං ගච්ඡති. දිළිඳු අයට ධනය නොදෙනවිට දිළිඳුකම රටේ රජයන බවත් එසේ දිළිඳුබව වැඩිවූවිට සොරකම, බොරුකීම, පරුෂ වචන කීම, කේලාම් කීම, අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යා දෘෂ්ටි යන දශ අකුශලයන් සමාජයේ පැතිර යන

බවත් කියවේ. මේ අනුව දිළිඳුකම රටක ඇතිවීමෙන් සමාජය ගුණධර්මවලින් පිරිහී එකිනෙකා ඇනකොටා ගෙන විනාශවෙන බව පෙනී යයි. රටක් කරවන පුද්ගලයා මිනිසුන් කාර්යයන්හි යෙදවිය යුත්තේ හැකියාව, දක්ෂතාවය, රුචිකත්වය ආදී කරුණු අනුවය. ගොවිතැන් කරන අයට ඊට අවශ්‍ය ධනය, කෙත්වතු ආදියද, වෙළඳාම් කැමති අයට ප්‍රාග් ධනය දීමද, කර්මාන්තකරුවන්ට ඔවුන් නිපදවන භාණ්ඩ වලට නියමිත මිලක් ද, දිරිගැන්වීම් ආදිය ද, රාජකාරි වල යෙදෙන්නවුන්ට ආරක්ෂාව හා සාධාරණ වැටුපක් ද දිය යුතුය. මෙසේ සුදුසුකම් අනුව එකිනෙකා තම කටයුතුවල නියලෙන කල්හි රටේ සාමය, සදචාරය බොහෝදුරට ආරක්ෂාවීම ස්වභාවයෙන්ම සිදුවේ.

නවීන ලෝකය දෙස බලනවිට ආර්ථික අතින් දියුණුයයි කියාගන්නා රටවල පවා රැකියා විරහිතව සිටින පිරිස් දැකිය හැකිය. මෙයට ප්‍රධාන හේතුවක් නම් බොහෝවිට මිනිස් ශ්‍රමයෙන් ගතහැකි බොහෝ කාර්යවලට අධිවේග ක්‍රියාකාරිත්වයෙන් යුතු යන්ත්‍ර සූත්‍ර යොදවා ගැනීමයි. මේ නිසා මිනිස් ශ්‍රමය විශාල වශයෙන් ඉතිරිවී ඇත. රැකියා විරහිත වූ පිරිස් මේ නිසා අසහනයට පත්වී රටට බරක් වී සිටින බව පෙනේ. ඔවුන් වෙනත් උපක්‍රම මගින් තම ජීවිතය ගැටගසා ගැනීමට විවිධ දූෂණවලට නැඹුරුවීමට හැකිය. ධනවතා තවතවත් ධනවත් කරන, දුප්පතා තව තවත් දුප්පත් කරන, ධනවතා අධිපෝෂණයටත්, දුප්පතා මන්දපෝෂණයටත් පත්කරවන විෂම ආර්ථිකයක් සඳහා බුදු දහමෙන් ඉඩක් නොලැබේ.

මිනිසාගේ ආශාවන්හි පරක් තෙරක් නැත. මේ නිසා නූතන ආර්ථික විද්‍යාවේදී අසීමිත ලෙස භාණ්ඩ නිපදවා මිනිසාගේ ආශාවන් සමනය කිරීමට උගන්වයි. නමුත් මිනිසාගේ ආශාවන් නිතර වෙනස්වන නිසා භාණ්ඩ නිපදවීමෙන්ම එය තුනී කිරීමට නො හැකිය. ඒ නිසා කළ යුත්තේ ආශාවන් තුළනය කිරීමය. ධනය ලැබීමෙන් පසුව ඇතිවන සැප හතරක් බුදුදහමේ උගන්වයි. අත්ථි සුඛය, භෝග සුඛය, අණන සුඛය, අනවජ්ජ සුඛය යනු ඒ හතරයි.[9] ධාර්මිකව උත්සාහයෙන් ලබාගත් ධනය ඇති බව අත්ථි සුඛයයි. ඒ ලබන ලද ධනය පරිභෝජනය කිරීමේදී ඇතිවනුයේ භෝග සුඛයයි. අය වැය නිවැරදිව යෙදවීමෙන් ණයතුරුස් නොවී සිටීමෙන් සිතට දැනෙන සුවය අණන සුඛයයි. සිත, කය, වචනය නිවැරැදිව යෙදවීමෙන් තමා ධාර්මිකව ධනයක් ලබාගත් බව පිළිබඳව සිතට දැනෙන සුවය අනවජ්ජ සුඛයයි. මෙයින් පෙනීයනුයේ බුදුදහම ධනය පිළිකුල් කිරීමක් නොකර ධනය තුළින් ජීවිතය නිවැරැදිව හදගත්විට තෘප්තිමත් ජීවිතයක් ගතකිරීමට ඇති හැකියාව පෙන්නුම් කරන බවයි. බෞද්ධ ආර්ථික දර්ශනය සාමාන්‍ය ආර්ථික විද්‍යාවෙන් වෙන් කරවනසුළු වැදගත් සාධක දෙකක් මෙහිදී ඉස්මතු වේ. එනම් බුදුදහම තම ආර්ථික දර්ශනයේදී භාණ්ඩ නිෂ්පාදනයට නොව මිනිසාට මුල් තැනක් දීමත්, ආර්ථික සුභ සිද්ධිය පිළිබඳව මෙන්ම මිනිසාගේ ආචාරාත්මක සුභසිද්ධිය කෙරෙහිද සැලකිල්ලක් දැක්වීමත් වැදගත් වේ.[10] මේ අනුව ධනය හරිහම්බ කර ගැනීමේ මාර්ගය බුදුදහම පෙන්වා දෙන අතර ඒ ධනය නිසාම මනුෂ්‍යත්වය කෙලෙසා ගැනීමට ඉඩක් දී නැත. තමන් රැස්කරන ධනය තමාගේ සුභසිද්ධිය සඳහා යොදගෙන පසුව එයින් සමාජයේ සුභසිද්ධිය සඳහා යෙදවිය යුතුය. ඒ සඳහා දනය, පරිත්‍යාගය වැනි ක්‍රම ද පෙන්වා ඇත. මේ අනුව ආර්ථිකය දියුණු කර ගන්නා පුද්ගලයා ගුණ ධර්මවලින් පෝෂණය වූවකු විය යුතු බව බුදුදහම අවධාරණය කරයි.

### ආශ්‍රිත පොත් පත්


1. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
2. සිඟාලෝවාද සූත්ත — දීඝනිකාය
3. අංගුත්තර නිකාය — චතුක්ත නිපාත, 250 පිට
4. සිඟාලෝවාද සූත්ත — දීඝනිකාය
5. ඛුද්දක පාඨ අට්ඨ කථා — නිධි. ඔපීයතික්ඛෙයති ගොපියතිති අත්ථො. සො චතුබ්බිධො ථාවරො ජඞ්මො අඞ්ග සමො අනුගාමිකොහොති.
6. චූල්ලකම්ම විභඞ්ග සුත්ත — මජ්ඣිම නිකාය
7. මහාචක්කවත්තිසීහනාද සුත්ත — දීඝනිකාය
8. කූටදන්ත සූත්ත
9. අංගුත්තර නිකාය, පත්තකම්ම වග්ග අණන සුත්ත
10. මිනිස් ගැටළු පිළිබඳ බෞද්ධ විග්‍රහය 09 පරිච්ඡෙදය, 183 පිටුව, කතෘ: තිස්ස ඥාණතිලක හිමි